SIDDHI




# නිමලා සහ බළලා

නමින් **"නිමල්"** වූ මා මේ කියනා චරිතය බොහෝ දෙනා කතා කලේ **"නිමලා"** යන නමිනි. සමහරු පොඩි උනට බත් කට පවා කැව්වේ **" ඔන්න නිමලා එනවා "** කියාය. ඒ තරමට ම කුඩා උන් පවා මේ පුද්ගලයා ගැන අසා බියව ඇති බැවින් නම කියවීමට පෙර ළමයි බත් ටික කන්නට පුරුදු වී සිටිති.
මහා ගිනි දාවල් කාගේ හෝ වත්තකට පැන හොරෙන් ටිංගා පොල්,තැඹිලි, කාටවත් නොදැනෙන්නට බාගන්නට නියම රුසියෙකි. සමහර දිනවල තැඹිලි හෝ පොල් ගසකට නැග එහි සිට ම ගෙඩියක් දෙකක් කපා බී, ලොඳ ද සූරා කා විඩා නිවාගෙන කපාගත් තැඹිලි වල්ල හෝ පොල් වල්ල උරහිසේ රුවාගෙන ගසින් බසී.

හොඳින් පැසී ගෙන එන කෙසෙල් කැණ දිහා බලා අයිතිකරුවනට සතුටුවන්නට ඇත්තේ ඉතා සුළු දවසකි. ඔවුන් කෙසෙල් කැණ කපා ගෙට ගන්නට පෙර **"නිමලා"** ඒ වගකීම බාරගනී. අයිතිකාරයා දවස් කීපයකට පසු කැන බලන්නට යනවිට පෙනෙන්නේ ගස නිරුපද්‍රිතව තිබිය දී කෙසෙල් කැණ අතුරුදහන් ව ඇති බවකි. ඒ විතරක් ද කුකුළකු ගේ කිකිළියක ගේ හීන් කෙඳිරියක්වත් නො ඇසී උන්වද කිහිල්ලේ රුවාගෙන යන්නේ මේ හොරගෙඩියා තමන් කවා පොවා ඇති දැඩිකල සතුන් ලෙසිනි.

ගෙපිලිකන්නේ තිබෙනා කැති, උදලු, පොරෝ කෙටි, බාල්දි, ඉනිමං ද පමණක් ද නොව ගස්වල ගස් ලබු, කොස්, දෙල් ද අතුරුදහන් වුණි. **"හොරාගෙ අම්මා ගෙන් පේන ඇහැව්වා වාගේ "** යන පිරුළ මට මේ වෙලාවේ මතක් වේ. **"නිමලා"**ව කුදලාගෙන යන්නට පොලිසිය ආ බොහෝ වෙලාවල් වලදී ඇය **"නිමලා"** ඉන්නා ඉසව්ව ගැන දන්නා නමුත් හැම වෙලාවක ම පාහේ කීවේ මාස ගානකින් ගෙවල් පැත්ත පලාතේ නො ආ බවකි.

පොලිසිය කීප විටක් ම **"නිමලා"**ව උසාවි දමා අච්චු කලමුත් ඒ හැමදාකදී ම **"නිමලා"**ගේ අම්මා අසල්වාසිනට වැද වැටී ඇප මුදල් දී ඔහු රැගෙන ආවේය. එනමුදු **"නිමලා"**ගේ මේ පුරුද්ද ඔහු අතහැරියේ නැත.

සමහර දිනවල දී නිමලා කලිසම ගස මුල ගලවා තබා යටි ඇඳුම පිටින් ගස් බඩගාන බව අපට වැටහුණේ අපේ පැටී ගේ ක්‍රියාවක් නිසාවෙනි. අපේ ගෙදර ආරක්ෂාවට ඇති දැඩි කල පැටී දහවල් කාලයේ රෝන්දේ යනවාය කියා බැඳ තබන්නට ඕනෑ"යි අම්මා නිතරම කියූ හැටි මතකය...දවසක් පැටී ගේ පිළිකන්නේ තරහින් ගොරවමින් කලිසමක් කීතු කීතු වලට ඉරමින් ඉන්නා බව අම්මා මට කීවේය. නිමලා ගසට නැගුනු පසු පැටී එයත් රැගෙන ගෙදර දිව ආ බව දැන් පැහැදිලිය."මේ වැඩේ අපේ එකා කලේ කියලා ඔය වසවර්තියා දැනගත්තොත් මේකාට වස ටිකක් හරි දාවී"යි කියමින් අම්මා එය පුච්චා දැමුවේය. එනමුදු කෙදිනක හෝ අපේ ගෙදරට සොර බියක් ගෙන දුන්නේ නැත. පැටී ගේ කලිසම් සොරකම මට විනෝදයක් ගෙන දෙන්නක් විය.

**හොරුන් ගෙත් හොරු ...කම්බා හොරු"**යි පැටී කල වැඩෙන් මට සිතුණ. එදා නිමලා ගසින් බැස කලිසමත් නොමැතිව ගියේ කෙසේදැයි මම නොදනිමි. බොහෝ වේලාවට කාගේ හෝ වැලක කලිසමක් නැත්නම් චීත්තයක් හෝ සොරා ගෙන ඇඳගෙන යන්නට ඉඩ ඇත. අනවශ්‍ය තැන්වල කලිසම් ගලවා තැබීමෙන් වූ සිද්ධිය හොඳ පාඩමකි. නමුත් පාඩමක් ඉගෙන නොගන්නා නිමලා දෙවැනි දවසේ ද ඔය ක්‍රියාවේ ම යෙදෙන්නට ඇත.

අපේ ගෙවල් යාබද ව වෙසෙන **"මිසි නැන්දා"** බොහෝ දිනවල දී අවට ආරංචියක් රැගෙන විත් අම්මා ගෙන් අඩුපාඩු යමක් ඉල්ලා ගනී. එ වැනි යමක් උවමනා වූ විට මොරටු ගම් දහ අටෙන් කොහේ හෝ සිදු වූ ආරංචියක් රැගෙන එනවාය.

දිනක් හදිසියේ දිව එන **"මිසි නැන්දා"** ගේ සතුටු ස්වරය මගේ කාමරයට ඇසේ. "ආන්න...හරි හොඳම වැඩේ...හොඳ අච්චුව...හැමෝටම ගිනි ගෙඩි දෙන හොර ගෙඩියා ගහකින් වැටිලා කොන්දත් බිඳිලා ලු...මේ ආරංචිය රසකර කර අම්මා හා කියනු මා අසා උන්නේ මීට වැඩි යමක් කිසිම අයෙකුගෙන් අසා දැනගන්නට බැරි බව දන්නා නිසාවෙනි.

**"නිමලා"**රෝහල් ගත කෙරුණු බවත්, කොන්දේ ඇට බිඳී ශල්‍යකර්මයකට භාජනය වූ බවත් පසුව ආරංචි වුණි. දැන් නිවැසියන් ගේ සොර බිය පහව ගොසිනි. වෙනදාට වඩා ගස්වල එල නිදහස් ව දිලේ.

බොහෝ කාලයකට පසු අළුයම් යාමයේ කුකුලන් ගේ හැඩලීම අවට කිහිප පොලකින් ම ඇසේ. ගෙපිලිකන්නේ කැත්තක්, උදැල්ලක්, බාල්දියක් ගෙදොර ට අවැසි යමක් තබා නිවසින් බැහැරව යාමට නිවැසියන්ට බියක් නැත. වැඩිහිටියනට කරදරයක් වූවා නම් වූයේ පුංචි උනට බත් ටික කවන්නට නවත් අලුත් **"භූතයකු"** ගැන කියා හිටින්නටය. දින සති මාස අතරට පෙරළෙමින් කාලය ගෙවී ගියේය. **"නිමලා"** ගසින් වැටුණු සිද්ධියෙන් පසු අවුරුද්දක් පමණ ගත වූවත් ඒ ගැන කිසිදු හෝඩුවාවක් නොවිය.

දිනක් මා යතුරු පැදියේ අමතර කොටසක් ගැනීමට කටුබැද්ද හන්දියට ගියෙමි. යතුරු පැදිය මෝටර් රථ අමතර කොටස් අලෙවි හල අසල නවතා වට පිට බලනා මට දකින්නට ලැබුණේ පදික වේදිකාවේ සිගමන් යදිනා දැක හුරු පුරුදු මුහුණකි. ඒ වෙනෙකෙකු නොව **"නිමලා"** ය. බොහෝ දුර්වල ව සිටි ඔහු ඕනෑ කමින් මා දිහා බලා අතපාන්නට විය. ඔහු මා හඳුනාගත්තා විය හැක. එනමුදු අතපානවා හැරෙන්නට කිසිදු වචනයක් මුවින් පිට නොවීය. මා අතැති මාරු කාසි කිහිපයක් ඔහු අත තැබීමි. අද ඔහුට හරි හැටි ඇවිදින්නට පුළුවන් කමක් නැත. එදාමෙන් කොහෙන් හෝ ඩැහැගත් යමක් විකුණා අහරක් බුදින්නට, බූරු පොළකට වදින්නට, රහ මෙර පානයේ යෙදෙන්නට වරමක් නැත.

මොහොතක් මගේ හිත නිමලා ගේ පසුගිය ක්‍රියාදාමයන් ඔස්සේ දිව යයි. ඇසිල්ලකින් ගසකින් අහසට නැග මුළු වටපිටාවේ ම තොරතුරු බලා ඉන් නොනැවතී ගිනි දාවලේ කල වැඩ කටයුතු හමාරය. අද අහසින් පොළවට වැටී අනන්ත දුක් විඳින්නේ නිමලා මේ ආත්මයේදී ම කල වැරදි වලට ප්‍රතිපලයක් වශයෙනි. නිමලා ගේ මේ සිදුවීමෙන් කලකට පසු මේ හා සමාන කතාන්තරයක් මට යලිත් මුණ ගැසෙයි.

දිනක් මගේ හිතවතකු වූ ලකී සමග ඔහුගේ වැඩිමහල් සොහොයුරිය වෙසෙනා පිළියන්දල ප්‍රදේශයේ ඇගේ ගෙදරට ගියෙමු. කන්දක් බැස පල්ලමේ ගෙදර පෙනෙන මානයේ පාර අද්දරට වී ලකී ගේ අක්කා මැටි කෝප්පයක් ද රැගෙන මග බලා හිඳී. "ෂුවර් එකට ඔය මාළු ගේනකම් වෙන්නැති බලාන ඉන්නේ...මේ පැත්තට ඉතින්...මොරටු වැල්ලෙන් හරි පාණදුර වැල්ලෙන් හරිනේ මාළු ගේන්නේ...බයිසිකලේ මාළු ගෙනාවොත් එදාට මාළු කාලා අහවරයි.

මාළු කාරයා කන්ද උඩදී මා... කියලා....වෝ...ඉවර වෙන්නේ අක්කලෑ ගේ ගාව පල්ලමේ දී. බයිසිකලේ පල්ලමේ කඩගෙන යනවා..මොන බ්රේක් ඇහිලිද...අක්කා මැටි කෝප්පෙ අරන් පාරට පනින කොට... මාළු කාරයා එහා ගමේ" ලකී ගේ කතාවට දෙදෙනාටම සිනහව නවත්වා ගන්නට බැරිය.

"මොකද හලෝ මේ පාරට වෙලා...කදේ මාළු ගෙනියනවනම් ඇහෙනවානේ...ලකී අක්කා ගෙන් අසයි.
නෑ...මල්ලි මේ හරියෙන් කද ගෙනියනකොට මාළෝ කියන්නෑ...හොර බළල් තඩියෙක් ඉන්නවා...උා හොඳට දන්නවා මාළෝ කියනකොට. මාළු ගෙනියන අයට හරිම කරදරයි ඒකාගෙන්...අපි දන්නවානෙ එන වෙලාව ඉතිං පාරට වෙලා උන්නාම ලේසියි. අක්කා ගේ ඒ කතාවේ සුල මුල කුමක්දැයි මට ප්‍රහේලිකාවකි.

දිනක් ලකී බළලා ගේ කතාව කියනා විට මට නිමලාත් මතක් උනි. මේ බළලා සාමාන්‍ය බළලෙකුට වඩා තුන් ගුණයකින් පමණ විශාල වූවෙකි. සමහරු හිතුවේ දහවලට සැරිසරන හොල්මනක් ලෙසටය. කිසිවෙකුටත් නොදැනෙන්නට එකවරම මාළු කදට කඩා පනින මේ බළල්තඩියා ඉන්නා ලොකුම කූරියෙක් ද රැගෙන ඇසිල්ලකින් කැළෑ රොදට වැදී නොපෙනී යන්නේය.

අසල්වාසීන් මේ සතාව කොටුකර ගන්නට මාන බලා සිටියත් බළලා ඊටත් වඩා සටකපටයකු වූයේය. සමහර දිනවලදී පිසූ මාළු හට්ටිය ඇර බලන විට හට්ටියේ මාළු කෑල්ලක්වත් ඉතිරිව නැත. ඒ තරම් ම කපටියකු වූ මේ බළලා කරමුඩිය අතින් ගසා මෑත්කර මාළු ටික ගිල දමා යලිත් අතින් ගසා තිබූ පරිදිම වසා දමා දුවන්නට සමර්ථයකු වූයේය. ප්‍රදේශවාසීන් මේ බළලාව හැඳින්වූයේ **"ගඩ්ඩා"** නමිනි.

මේ කතා ද අසා කලක් ගතවුණි. ලකී ආයේමත් දවසක **"ගඩ්ඩා"** ගේ අලුත් ම තොරතුරු මට කීවේ සිනහවක් ද උපදවමින්ය. කෙනෙකු අමාරුවක වැටුණ කල සිනහවීමට හොඳ නැත. නමුත් **"නිමලා"**ට වූ දේ ම **"ගඩ්ඩා"**ටද වී හමාරය. කාලයක් ම හොරා කෑ "ගඩ්ඩා"ගේ කුරුමානම දිනක් වැරදී ගියේය. තමන් ගේ ප්‍රමාණයටත් වඩා විශාල මාළු කූරියකු ඩැහැගන්නට යාමේ දී මාළුවා ගේ බර වැඩිකමට"ගඩ්ඩා"ට දිවීමට අපහසු විය. මාළු විකුණන්නා මාළු කපන මන්නා පිහියෙන් "ගඩ්ඩා"ට පත බෑවේ ආයේ නොඑනා ගමන් යන්නටය. ඒ මන්නා පිහි පාරත් කාගෙන "ගඩ්ඩා" මාළු කූරියා ද අත හැරදා අතුරුදහන් විය. සියල්ලෝම සිතුවේ කොහේ හෝ පඳුරක් අස්සේ "ගඩ්ඩා"මැරී ඇතැයි කියාය.

තවද කාලයක් ගතවුණි. මාළු විකුණන්නන් පෙර සේ බියක් නැතිව, වට පිට බල බලා මාළු කපන්නේ නැතිව ඔවුනගේ කාර්යය කරගෙන යනු ලබයි. දැන් නිදහස් වූ පරිසරයකි. මාළු සුද්ද කරන අතර තුරේ ඈතට වී බලා ඉන්නා බළලුන් තමන් ගේ වාරයට මාළු වරලක් හෝ කරමලක් විසි කරන තෙක් බලා සිටී. කිසිම සණ්ඩු සරුවලයක් නැතිව තමන්ට ලැබෙනා කොටස භුක්ති විඳින්නට ඔවුන් සූදානම්ය. එලෙස වන්නට ඇත්තේ කලකට පෙර "ගඩ්ඩා" මන්නා පිහිපාරකින් සංග්‍රහයක් අත්විඳිනු දුටු සාක්ෂිකරුවන් ලෙසය. තිරිසන් සතෙකුට වුවද දෙවන වර වන අකරතැබ්බය ඔවුනට ඉවෙන් මෙන් දැනේ.

කාලය මෙසේ ගෙවෙද්දී දිනක් මාළු ගන්නා ලකී ගේ අක්කාට හා මාළු වෙළෙන්දාට අමුතු ම මාදිලියේ බළලකු හඩන හඩක් ඇසේ. සාමාන්‍යයෙන් බළලකු හඩන්නේ "ඤාව්"..."ඤාව්" යන ස්වරයෙනි. නමුත් මේ ගොරෝසු හඩින් ඇසෙන්නේ "ඤාව්..ව...ඤාව්...ව කියාය. මුක්කන් හඩක ස්වරයකි. තරමක කේන්තියකින් ලකී ගේ අක්කා "කව්ද මේ කෝළමට එන්නේ...කියා වට පිට බැලීය.

පුදුමයකි...පාරත් එහා පැත්තේ කම්බි වැට අස්සෙන් හොර බළල්තඩියා ගේ මුහුණ පෙනේ. එදා රවුම් වොලිබෝලයක් වගේ තිබූ මුහුණ අද බිම වැටී වප්ප වුන "ලා වුළු" ගෙඩියක් සේය. මුහුණේ හැඩය වෙනස්ය. ඔද තෙද බිඳී ගොස්ය. ඇසත් නාසයත් කටත් දක්වා බාගෙට සුව වූ විශාල කැපුම් පහරකි. මේ කැපුම් පහර නිසා සදාකල් හරිහැටි "ඤාව්" කියාගන්නට බැරි ස්වර ආබාධිතයෙකි. හරිහැටි නැගිට සිටින්නට බැරිය.

වෙනදා කූරියා පිටින් ම ගිල දැමූ "ගඩ්ඩා"ට අද මාළු වරලක වත් රස බලන්නට ඉඩක් නැත. ඔහුට වඩා ක්‍රියාශීලී අවට බළලුන් අද ඒවායේ රස විඳිති. "ගඩ්ඩා"ගේ වික්‍රමයත් හමාරය. යමක් හිතන්නට හැකි මිනිසෙකුට වඩා මෙවැනි ඉරණමකට ගොදුරු වූ අසරණ තිරිසන් සත්ත්වයා ගැන අප තුල අනුකම්පා-වක් උපදී. එනමුදු මේ කතා දෙක ම අවසානයේ හැඟෙන්නේ නිමලාත් බළලාත් දෙදෙනාම විඳවන්නේ එකම කරුමයකි. කල වැරදි බූමරංගය සේ තමන් සොයා ඒම කාට වැළැක්විය හැකිද?...

